# නැගෙනහිර නව මුහුදු පුරාවිද්‍යා අනාවරණ හා මඩකලපුව ආශ්‍රිත මුහුදේ ගිලීගිය "සර් ජෝන් ජැක්සන් වාෂ්ප නෞකාව"

# (SS Sir John Jackson Boiler Wreck)

**ඩබ්. එච්. රුෂාන් ප්‍රියන්දන[1] හා එස්. එම්. නන්දදාස[2]**
ඩබ්. එච්. රුෂාන් ප්‍රියන්දන, මුහුදු පුරාවිද්‍යා ඒකකය, ගාල්ල, priyandana@gmail.com

එස්. එම්. නන්දදාස, මුහුදු පුරාවිද්‍යා ඒකකය, ගාල්ල,

## හැඳින්වීම

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයට අයත් මධ්‍යම සංස්කෘතික අරමුදල (Central Cultural Fund- CCF) යටතේ ක්‍රියාත්මක වන ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය (Maritime Archaeology Unit-MAU) ශ්‍රී ලංකාව වටා මුහුදු කලාපයේ සිදු කළ මුහුදු පුරාවිද්‍යාත්මක පර්යේෂණ බොහෝය. දශක තුනක් තිස්සේ පැවති යුධමය වාතාවරණය අවසන්වීමත් සමග ශ්‍රී ලංකාවේ වයඹ, උතුරු හා නැගෙනහිර මුහුදු කලාපයන්හී බාධාවකින් තොරව දියයට පුරාවිද්‍යාත්මක කටයුතු සිදු කිරීමේ හැකියාව මේ වන විට උදාවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකය මිගින් මේ දක්වා සිදු කරනු ලැබූ පර්යේෂණ හලාවත, පුත්තලම, කල්පිටිය, මන්නාරම, පොතුවිල්, මඩකලපුව, ත්‍රිකුණාමලය, මුලතිව්, යාපනය, ඩෙල්ෆ්ට් ආදී මුහුදු ප්‍රදේශ දක්වා තවදුරටත් ව්‍යාප්ත කිරීමට හැකිවිය.

## අන්තර්ගතය

2012 දී සිදු කරන ලද ගවේෂණ කටයුතු මගින් සාර්ථක ප්‍රතිඵල අත් වූ අතර මෙතෙක් අවධානයට ලක් නොවූ මුහුදු පුරාවිද්‍යා ක්ෂේත්‍ර රාශියක් අනාවරණය කරගැනීමට හැකිවිය. මෙම පර්යේෂණවල පළමු අදියර වශයෙන් මේ වන තෙක් නිසි අවධානයකට ලක් නොවූ නැගෙනහිර මුහුදු ප්‍රදේශය ගවේෂණය කිරීමට හැකියාව උදාවිය.

## පර්යේෂණයේ මූලික අරමුණු

1. නැගෙනහිර මුහුදු තීරය හා අවට ප්‍රදේශයන්හි පුරාවිද්‍යා හා ජලාශ්‍රිත පුරාවිද්‍යා සාධක සොයා ගැනීම හා වාර්තාගත කිරීම.
2. ගවේෂණයට ලක්වන ප්‍රදේශයන්හි ජලාශ්‍රිත උරුමයන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම හා එම ප්‍රදේශවල සිටින මහජනයා දැනුවත් කිරීම.
3. වංශකතා ආශ්‍රිත ඓතිහාසික තොරතුරු හා පැරණි වරායන් පිළිබඳ තොරතුරු ගවේෂණය.
4. 2011 වසරේදී උප්පුවේලි ප්‍රදේශයෙන් හමු වූ නව පුරාක්ෂේත්‍රය (විශාල කාලතුවක්කු සහිත නෞකාව) පිළිබඳ වැඩිදුර පර්යේෂණ කටයුතු සිදුකිරීම.
5. දැනට වාර්තා වී තිබෙන නිශ්චිත ස්ථාන හඳුනාගෙන. ගිලුණු නෞකා හා පුරාක්ෂේත්‍ර වාර්තාගත කිරීම.
6. පුරාවිද්‍යා දත්ත හා සාධක ඇතැයි නිශ්චිත වශයෙන්ම ඉලක්ක කර ඇති ස්ථාන කිමිදුම් හා දුරස්ථ සන්වේදක (Remote Sensing) ක්‍රම මගින් ගවේෂණය කිරීම.
7. නැගෙනහිර ප්‍රදේශයේ දැනට කිමිඳුම් කටයුතුවල යෙදෙන ධීවරයින් කිමිදුම්කරුවන් හා නාවික කිමිදුම්කරුවන් සමග ඉදිරි කටයතු සිදහා සුදුසු සබඳතා ගොඩනගා ගැනීම.
8. සමුද්‍ර ගවේෂණය හා කිමිදුම් කටයුතු සමග සම්බන්ධ වන අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සබඳතා

ගොඩනගා ගැනීම. දැනුම හා තාක්ෂණය හුවමාරු කර ගැනිම.

9. ජලාශ්‍රිත පුරාවිද්‍යා ක්ෂේත්‍ර කටයුතුවලදී ඒ හා සම්බන්ධ අන්තර්ජාතික ආයතන හා සම්බන්ධවීම හා විශේෂඥතා දැනුම හුවමාරු කර ගැනීම.

මේ අනුව සිදු කරන ලද පර්යේෂණයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් නැගෙනහිර ආශ්‍රිතව ගිලුණු නෞකා 17 සොයාගැනීමට හැකියාව ලැබිණි. ඒ අතරින් මඩකලපුව දිස්ත්‍රික්කයේ නාවලඩි ප්‍රදේශීය බල ප්‍රදේශයේ නාවලඩි කලපුවේ සිට කිලෝමීටර 3ක් පමණ දුරින් මුහුදු බත් වී ඇති අපගේ අවධානයට ලක්කරන නෞකාවේ අවශේෂ මීටර 9ක් පමණ ගැඹුරේ තැන්පත් ව ඇත. නෞකාව පිළිබිඳ තොරතුරු අනාවරණය කරගැනීමට හැකි වූයේ ප්‍රදේශයේ කිමිදුම්කරුවකු වන ජේ. යෝගරාජාගේ සහය මතය.

ශ්‍රී ලංකාවේදී මෙතෙක් සිදුකරනු ලැබූ ගවේෂණයේ දී හමුව ඇති වාෂ්ප බලයෙන් ක්‍රියාත්මක වන බොයිලේරු 5කින් යුක්ත එක ම නෞකාව ලෙස මෙම නෞකාව හඳුනාගත හැකි වේ. අවර පෙති (Propeller) දෙකකකින් යුත් මෙහි වර්තමාණයේ ඉතිරිව පවතින්නේ එක් අවර පෙත්තක් පමණි. අවර දඬු දෙක (Propeller Shaft) ආරක්ෂා වී ඇත. ඉදිරිපස හා පිටුපස කොටස පහසුවෙන් හඳුනාගත හැකි පරිදි තැන්පත්ව ඇත. යකඩ කපන්නන්ගේ ග්‍රහණයට ලක්ව ඇති මෙකී නෞකාවේ බොහෝ කොටස් විනාශයට ලක්ව ඇත.

ගවේෂණයෙන් අනතුරුව සිදු කළ මූලාශ්‍ර අධ්‍යයනයේදී මෙම නෞකාව එස්. එස්. සර් ජෝන් ජැක්සන් (SS Sir John Jackson) නෞකාව ලෙසින් අනාවරණය කරගැනීමට හැකියාව ලැබුණි.

ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවට ගොස් 19වන සියවසේ අග භාගයේ හා 20වන සියවස මුල් භාගයේ ප්‍රකාශයට පත්කරන ලද පුවත්පත් සියල්ල ඉතා සුපරීක්ෂාකාරීව අධ්‍යනය කිරීමේදී ගිලීගිය නෞකා පිළිබිඳව වැදගත් තොරතුරු රැසක් අනාවරණය කරගැනීමට හැකියාව ලැබිණි. සර් ජෝන් ජැක්සන් වාෂ්ප නෞකාව අනතුරට ලක්වීම පිළිබඳව ශ්‍රී ලංකාවේ එවකට ප්‍රකාශිත ද සිලෝන් ඔබ්සවර් (The Ceylon Observer) පුවත්පත හා ද ටයිම්ස් ඔෆ් සිලෝන් (The Times of Ceylon) පුවත්පත්හි අවස්ථා කිහිපයකදීම වාර්තා කර ඇත.


නෞකාවේ සම්පූර්ණ බර ටොන් 4231කි. ශුද්ධ බර ටොන් 2767කි. නැවේ කපිතාන්වරයා වූයේ ඩබ්ලිව් ග්‍රීන් මහතා ය. නැව 1905 දී "නිව් කාසල්හි නොදම්බර්ලන්ඩ්" නම් නැව් ඉදි කරන සමාගම විසින් තනන ලද්දකි. එය ලන්ඩනයේ ලියාපදිංචි කරන ලද "වෙස්ට්මිනිස්ටර්" (Westminster Shipping co; Ltd) නැව් සමාගමට අයත් වූවකි. දිග අඩි 360 යි අඟල් 4 කි. පළල අඩි 47 අඟල් 09කි. ගැඹුර අඩි 20 අඟල් 02කි. නියෝජිත ආයතනය වන්නේ මෙසර්ස් ඩෙල්මේජ් රීඩ් සහ සමාගමයි. නෞකාව අනතුරට පත්වූ දිනය ලෙස සටහන් වන්නේ 1908.09.26වන දිනයි.

සිලෝන් ස්ටීම් ෂිප් (Ceylon steam ship) සමාගමට අයත් "ලේඩි මැකලම් වාෂ්ප නෞකාව" "සර් ජෝන් ජැක්සන්" අනතුරට පත් වූ ස්ථානයට පැමිණ තිබේ. "ලේඩි මැකලම්" යාත්‍රාවෙහි කපිතාන් රොබින් මහතා සහ දෙවැනි ඉංජිනේරුවරයා අනතුරට පත් "ජෝන් ජැක්සන්" නැවට පැමිණ ඇත. ඔවුන් විසින් එම අනතුරට පත් නැව බේරා ගැනීම සිදහා කළ හැකි සියල්ල කිරීමට ඉදිරිපත් විය.

Sir John Jackson නෞකාවේ කපිතාන්වරයා පවසා ඇත්තේ නැවට සිදු වූ අනතුර පිළිබිඳ දීර්ඝ වශයෙන් කරුණු දැක්වීමට යාම ඒ පිළිබිඳ තීරණ ගන්නන්ට වැරදි අවබෝධයක් ලබා ගැනීමට හේතුවිය හැකි නිසා එසේ නොකරන බවයි.

යාත්‍රාව ගැටුණු ගල් කුලු හඳුන්වනු ලබන්නේ බ්‍රීනස් ෂෝල් (Brennus Showl) නමිනි. අනතුර සිදු වන විට නෞකාව සහල් හා තිරිගු පටවාගෙන "සයිගොන්" (වර්තමාන වියට්නාමයේ හෝචිමින් සිට) සිට පැමිණෙමින් තිබුණි. අවශ්‍යය ගල් අඟුරු හිග වීම නිසා ඒවා ලබා ගැනීමට මෙරටට පැමිණෙමින් සිට ඇත. නැවෙහි තිරිගු ප්‍රමාණයට වඩා සහල් තිබිණි. නැව බේරා ගැනීම පිළිබිඳ අදහස් දැක්වීමේදී මෙම සාධකය බලවත් අවධානයට ලක් වී ඇත. නැව් බඩු ප්‍රවාහනය පිළිබඳ පරිචයක් ඇති රජයේ නිළධාරියෙකු පත්තර වාර්තාකරුවකුට පවසා ඇත්තේ "*නැව බේරා ගැනීමට ඇත්තේ ඉතා සුලු ඉඩකඩකි. නැව*

*සහල්වලින් පිරී තිබෙන බැවින් ජලය කාන්දු වී සහල් තෙත් වන විට ඇති වන බර හා පීඩනය නැවට දරා ගත හැකිවේද යන ගැටලුව පවතින බවයි. මේ අනුව නැව දෙකඩ වී යාමට හේතු විය හැක. බිනස් ෂෝල් වශයෙන් හඳුන්වන කොරල් පරය මත නෞකාව ඉතා තදින් ගැටී පවතී. ඉදිරිපස කුටීර දෙකක වතුර පිරී ඇති අතර ජලය ඉවතට පොම්ප කිරීම අඛණ්ඩව සිදු කෙරෙමින් පවතින බවයි"*




SS Sir John Jackson නෞකාව මුහුදු පත්ලේ තැන්පත්ව ඇති ආකාරය

## නිගමනය

මේ අනුව නෞකාව බේරා ගැනීමට දරන ලද උපායන් සියල්ල ව්‍යර්ථ කරමින් එය මුහුදුබත්ව තිබේ. නෞකාව මුහුදු පත්ලේ තැන්පත්ව තිබෙන්නේ ද කොටස් දෙකකටය. නෞකාවේ උපරිම දිග මීටර 102.80 පමණ වේ. එනම් අඩි 340කි. නෞකාව නිර්මාණයේදී තිබූ මුලු දිග ලෙස සටහන් වන්නේ අඩි 360කි. මෙකී නෞකාව අසල ගිලීගිය තවත් නෞකාවක තොරතුරු හමුවිය. බොයිලර් තුනකින් යුත් මෙකී නෞකාව හා බොයිලර් පහකින් යුත් Sir John Jackson නෞකාව පැහැදිලිව හිඳුනාගැනීමට මුහුදු පුරාවිද්‍යා ඒකකයට හැකියාව ලැබුණි.

## ආශ්‍රේය ග්‍රන්ථ

දි සිලෝන් ඔබ්සවර්; 1908, සැප්තැම්බර් 28 සඳුදා සවස මුද්‍රණය

ද ටයිම්ස් ඔෆ් සිලෝන්; 1908, සැප්තැම්බර් 28 සඳුදා සවස මුද්‍රණය

ද ටයිම්ස් ඔෆ් සිලෝන්; 1908, ඔක්තෝම්බර් 01 බ්‍රහස්පතින්දා

http://www.plimsoll.org/resources/SCCLibraries/WreckReports2002/19610.asp

http://www.wrecksite.eu/wreck.aspx?104331